**වෙන්කලචෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය සභාව**
**-----------------------------------**
**වවුනියාව දිස්ත්‍රික්කය**
**-----------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2019 ජූනි 30 දින හා 2019 ඔක්තෝබර් 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට **වෙන්කලචෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය** සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-------------------------------------------

**(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (2) වන උප වගන්තියට අනුව, මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික විගණන පනතේ උපදෙස් පිළිපැදිය යුතුය. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සභාව විසින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | ඉදිරි කාලවලදී ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ. |

(ඇ) **ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මේ දක්වා වූ රු. 111,213,002 ක් වටිනා වත්කම් සඳහා ක්ෂය කිරීම් සිදු කර නොතිබුණි. | වත්කම් සඳහා ක්ෂය වෙන් කළ යුතුය. | ඉදිරි කාලවලදී වත්කම්වල වටිනාකම තක්සේරු කිරීමට සහ ක්ෂය සම්බන්ධයෙන් සටහන් තබා ගැනීමට පියවර ගනු ලැබේ. |

(ඇ) **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.57,033,764 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලිවල ලිඛිත සාක්ෂි වන ඉඩම් ඔප්පු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සහතික කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඉඩම් ඔප්පු ලබා ගැනීම සම්බන්ධයෙන් අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තිය | | නීති විධිවිධාන ප්‍රකාරව සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සිදුකර නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණය වාර්ෂික සැලැස්මට ඇතුළත් කළ යුතුය. | වාහන පහසුකම් හා කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් විශාල වශයෙන් කසළ එකතු කිරීමට නොහැකි විය. |
| (ආ) | 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන අඥාපනත යටතේ බලාත්මක කරන ලද අතුරු නීති | | සණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වාර්ෂික සැලැස්මක් සකස් කර නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණය වාර්ෂික සැලැස්මට ඇතුළත් කළ යුතුය. | සකස් කිරීමට මේ වන විට පියවර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| විධිවිධාන XI සහ XII වගන්ති. | | | |
| (ඇ) 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත | සණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | පනතේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | ඉදිරි කාලවලදී මේ සම්බන්ධයෙන් පියවර ගනු ලැබේ. |
| (ඈ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති අංක 178 (3) | භාණ්ඩ සපයන ආයතන සම්බන්ධයෙන් ලැයිස්තුවක් සකස් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | භාණ්ඩ සපයන ආයතන සම්බන්ධයෙන් ලැයිස්තුවක් පිළියෙල කිරීමට පියවර ගෙන තිබුණි. |
| (ii) රීති අංක 218 | සියළු ඉඩම් හා ගොඩනැගිලි සභාපතිවරයා විසින් අවම වශයෙන් වර්ෂයකට එක් වරක්වත් පරීක්ෂා කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඒවා සභාපතිවරයා විසින් මේ වනවිට පරීක්ෂා කරනු ලැබේ. |
| (iii) රීති අංක 33 | තක්සේරු බද්ද සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දේපල සඳහා තක්සේරු බද්ද අයකර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. |
| (iv) III කොටසෙහි 32 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා දේපල තක්සේරු බද්ද පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | තක්සේරු බද්ද අය කර ගැනීමට පියවර ගෙන තිබුණි. |
| **(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි සම්බන්ධ ලේඛණ නඩත්තු කර නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | හානි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යාමට පියවර ගෙන තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 96,696 | ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ . | ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (iii) මුදල් රෙගුලාසි 891 | ඇප ලේඛණය නඩත්තු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඇප ලේඛණය මේ වනවිට පවත්වා ගෙන ගොස් තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | පළාත් මූල්‍ය රීති 12,999 අංක 163.3 | හිඟ අත්තිකාරම් මුදල් අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මුදල් රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ . | එය නිවැරදි කිරීමට පියවර ගනිමින් සිටී. |
| (උ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදය | සෑම වසරකට වරක් ටැංකියේ ඉන්ධන සම්පූර්ණයෙන්ම පුරවා වාහනය ධාවනය කිරීමෙන් ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කළ යුතුය. කෙසේ වෙතත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ . | ධාවන තත්ත්වයේ පවතින වාහන සඳහා ඉන්ධන දහනය පරීක්ෂා කර තිබුණි. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ එකතු කළ අගය මත බද්ද (VAT) සම්බන්ධ ගනුදෙනු වලදී, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය ප්‍රකාරව භාණ්ඩ හෝ ඉදිකිරීම් කටයුතු මත එකතුකළ අගය මත බද්ද ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට/ සැපයුම්කරුවන්ට ගෙවිය යුතුය. එම ගෙවීම් පිළිබඳ විස්තර ඊළඟ මාසයේ 15 වන දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. වැඩ කටයුතු දෙකක් සිදු කර ඇතත්, රු.783,364 ක් වූ එකතු කළ අගය මත ගෙවූ බදු මුදලක් සම්බන්ධයෙන් විගණනයට දැනුම් දී නොතිබුණි. | එකතු කළ අගය මත බදු සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | පසුගිය වර්ෂයේ එකතු කළ අගය මත බදු ගෙවීම් සම්බන්ධයෙන් විගණනයට දැනුම් දී නොතිබුණි. ජනවාරි මාසයේ සිට එකී ක්‍රියා පටිපාටිය අනුගමනය කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,723,209 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,955,022ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| (ii) | කුලී | 5,083,000 | 8,193,746 | 5,428,263 | 2,765,483 | 4,270,000 | 6,248,305 | 5,174,410 | 1,073,895 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 940,000 | 793,166 | 793,166 | - | 725,000 | 3,390,165 | 3,390,125 | - |
| (iv) | වෙනත් ආදායම් | 9,237,000 | 11,709,798 | 5,902,629 | 5,807,169 | 8,265,000 | 14,530,648 | 9,645,776 | 4,884,872 |
| | එකතුව | **15,260,000** | **20,696,710** | **12,124,058** | **8,572,652** | **13,260,000** | **24,169,118** | **18,210,351** | **5,958,767** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දින වන විටත් ආදායම් ණය ගැතියන්ගෙන් අය වියයුතුව තිබුණු රු.9,999,346 ක මුදල අයකර ගැනීමට සභාව විසින් ක්‍රියා කර නොතිබුණි. | ආදායම් ණය ගැතියන්ගෙන් අය වියයුතු මුදල අයකර ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට වූ රු.8,572,652 ක හිඟ ආදායම් අයකර ගැනීමට සභාව විසින් කිසිදු අර්ථවත් පියවරක් ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගත යුතුය. | හිඟ කල්බදු අයකර ගැනීමට සභාව පියවර ගනිමින් සිටී. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | 2016 සිට 2018 දක්වා වූ පසුගිය වසර සඳහා සභාවේ විෂය පථය යටතේ වූ එකතුව රු.1,109,057 ක් වූ හිඟ වාහන කුලී අය කර ගෙන නොතිබුණි. | සියලුම කුටිවල හිඟ කුලී මුදල් අයකර ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. | නීතිමය පියවර ගෙන ඇත. |
| (ආ) | එකතු වටිනාකම රු. 370,673 ක් වූ සභාවේ විෂය පථය යටතේ වූ හිඟ කල්බදු මුදල් අය කර ගෙන නොතිබුණි. | කුටිවල හිඟ කුලී මුදල් අය කර ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. | නීතිමය පියවර ගෙන ඇත. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**(අ) උසාවි දඩ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 වන දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ සියලු බලධාරීන්ගෙන් එකතු වටිනාකම රු.4,326,452 ක උසාවි දඩ මුදලක් ලැබිය යුතුව පැවතිණි. | උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ වර්ෂයේදී අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටියද උසාවි දඩ මුදල් අප වෙත ලැබී නොතිබුණි. |

**(ආ ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 වන දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ සියලු බලධාරීන්ගෙන් එකතු වටිනාකම රු.500,000 ක මුද්දර ගාස්තු මුදලක් ලැබිය යුතුව පැවතිණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ වර්ෂයේදී අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටියද, මුද්දර ගාස්තු මේ දක්වා අප වෙත ලැබී නොතිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මහජන සෞඛ්‍ය, මහජන උපයෝගීතා සේවා සහ මහජන මංපෙත් විධිමත් කිරීම සහ සුවපහසුව, පහසුව සහ ජනතාවගේ සුභසාධනය වැනි කාරණා විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු විය. නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | ගැසට් පත්‍රයේ පළ කිරීමට පියවර ගෙන තිබුණි. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. | 2018 දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. 2019 වර්ෂයේදී පිළියෙල කිරීමට පියවර ගෙන තිබුණි. |

(ඇ) **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | කසළ බැහැර කරන ස්ථාන සඳහා පාරිසරික බලපත්‍රය ලබාගෙන නොමැත. | සන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි ලෙස ස්ථාපිත කළ යුතු අතර අපද්‍රව්‍ය වෙන්කිරීම විධිමත් කිරීම හා ඒවා නැවත භාවිතා කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම හා පරිසරයට හානියක් නොවන පරිදි ක්‍රියාත්මක කිරීමෙන් ස්වාභාවික පොහොර නිපදවීමට පියවර ගත යුතුය. | අදාළ ස්ථාන සඳහා බලපත්‍ර ලබා ගැනීමට පියවර ගෙන තිබුණි. |
| (ii) | කසළ වෙන වෙනම වර්ගීකරණය කොට එකතු කර නොතිබුණි. | | අරමුදල් ප්‍රභවයන් සහ වාහන පහසුකම් ලබා ගැනීමේදී එය ක්‍රියාත්මක කෙරේ. |
| (iii) | සභාවේ කසළ බැහැර කරන ස්ථානයට ගෙන එන කසළ වර්ගීකරණය කිරීමේ වැඩ සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි. | | අරමුදල් ප්‍රභවයන් සහ වාහන පහසුකම් ලබා ගැනීමේදී එය ක්‍රියාත්මක කෙරේ. |
| (iv) | සභාවට අයත් ප්‍රදේශයේ නිවාස සහ කුටිවලින් කුණු කසළ වෙන් වෙන් වශයෙන් වර්ගීකරණය කොට ඒවා මලුවලට එකතු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | | අදාළ පියවර ගනු ලැබේ. |
| (v) | සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව නිලධාරීන්ට ලබා දී නොතිබුණි. මේ සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | | නිලධාරීන්ට පුහුණුව ලබාදෙනු ඇත. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක ඒ.එස්.පොදු/2018/61 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සභාවේ පෙර සූදානම් වීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. | තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සභාව පෙර සූදානම් වීම සම්බන්ධයෙන් මේ වන විට පියවර ගනිමින් සිටී. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | තේරීපත් වූ කොන්ත්‍රාත්කරුවෙකු සභාව විසින් තෝරා නොගැනීම නිසා උසාවි වියදමක් ලෙස රු.903,779 ක් ගෙවා තිබුණි. | සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට පියවර ගත යුතුය. | නිශ්චිත මාර්ග කටයුතු සම්බන්ධයෙන් අදාළ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුව කොන්ත්‍රාත්කරු තෝරාගෙන ඇති බව දන්වා සිටිමු. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දින වන විටත් ණය හිමියන්ට ගෙවිය යුතු රු.174,673 ක මුදලක් ගෙවීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එම මුදල ණය හිමියන්ට ගෙවීමට පියවර ගත යුතුය. | රඳවුම් මුදල් ණය හිමියන්ගේ ගිණුමට මාරු කර තිබුණි. මෙම ගිණුම 2019 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී සභාවේ අංක NP ZD 2168 දරන වාහනය සඳහා ආදායම් බලපත්‍රයක් ලබා ගැනීමේදී රු.22,480 ක දඩ මුදලක් ගෙවා තිබුණි. | නියමිත කාල සීමාව තුළ වාහන ආදායම් බලපත්‍රයක් ලබා ගැනීමට පියවර ගත යුතුය. | වාහන ආදායම් බලපත්‍රයේ හිඟ මුදල් ගෙවීමෙන් ආදායම් බලපත්‍රය ලබාගෙන තිබුණි. එනිසා 2007 සිට 2018 දක්වා කාල සීමාව සඳහා රු.22,480 ක් දඩ මුදලක් ලෙස ගෙවීමට සිදුව තිබුණි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) සේවක මණ්ඩල පුරප්පාඩු** සභාවේ කාර්යමණ්ඩල පුරප්පාඩු 10 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට පුරවා නොතිබුණි. | කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවිය යුතුය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, පරිපාලන වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණි. |
| **(ආ) සේවක ඇප තැන්පත්** සභාවෙන් ඉවත් වූ නිලධාරීන් 02 ගෙන් ලබාගත් රු.37,000 ක ආරක්ෂක ඇප තැන්පතු සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ආරක්ෂක ඇප තැන්පතු පියවීමට පියවර ගත යුතුය. | පියවර ගනිමින් පවතී. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය කරමින් සභාව විසින් භාවිතා නොකළ වාහන 06 ක් භාවිතා කිරීමට හෝ විකිණීමට මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | භාවිතයට ගත හැකි ආකාරයෙන් අලුත්වැඩියා කිරීමට හෝ ඒවා අපහරණය කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. | වාහනයේ අයිතිය පැවරීමෙන් පසු අපහරණය කිරීමට පියවර ගෙන තිබේ. |

**3.4.2 පවරානොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- | --- |
| (අ) | සභාවට අයත් ඉඩම් සම්බන්ධයෙන් අනාවරණය කිරීම් කර නොතිබුණි. නිතිපතා | සභාවට හිමිකාරිත්වය පැවරීමට පියවර ගත යුතුය. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඉඩම් ඔප්පු ලබා ගැනීම සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | ඉඩම් සත්‍යාපනය කිරීමෙන් සභාවට අයත් එවැනි වත්කම්වල අයිතිය සහතික කර නොතිබුණි. | | |
| (ආ) | සභාවට පරිත්‍යාග කරන ලද වාහන දහයක හිමිකාරිත්වය සභාවට පවරා නොතිබුණි. | සභාවට හිමිකාරිත්වය පැවරීමට පියවර ගත යුතුය. | සභාවට අයත් නොවන වාහන 12 ක් සම්බන්ධයෙන් පියවර ගනිමින් පවතී. |

**3.4.3 නිෂ්ක්‍රිය වත්කම්**

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සාප්පු සංකීර්ණ ගොඩනැගිලි නිෂ්කාර්යව පැවති අතර ඒවා භාවිතා කිරීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඒවා භාවිතා කිරීමට පියවර ගත යුතුය. | කුරුක්කල් පුතුකුලම් වෙළඳපොල සාප්පු සංකීර්ණය, සහ සභාවේ කනේෂපුරම් සාප්පු සංකීර්ණය සඳහා 2018 වසරේදී ටෙන්ඩර් කැඳවා තිබුණි. කෙසේ වෙතත්, කිසිවෙකු ඒවා නොගත් නිසා ඒවා නිෂ්ක්‍රියව පැවතුණි. |

**3.4.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පිළිබඳ වාර්තාව මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවර ගත යුතුය. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර ඇති අතර භාණ්ඩ විනාශ කර ඇත. කෙසේ වෙතත්, ඒ සඳහා කපාහැරීමේ නියෝගයක් ලබාගෙන නොතිබුණි. ඒ සඳහා පියවර ගෙන තිබුණි. |

**3.5 ප්‍රසම්පාදනය**

---------------

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු.964,484 ක ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට පියවර ගත යුතුය. | 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ඉදිරි කාලවලදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට පියවර ගෙන තිබුණි. |

## 4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

------------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබුණු අතර ඇස්තමේන්තුව නිසිලෙස සැලසුම් කර වැඩසටහන් ගත කර නොතිබුණු අතර ඒ අනුව අයවැයගත ආදායම සහ තථ්‍ය ආදායම අතර රු.5,310 සිට රු.7,311,169 ක් දක්වා විචලනයන් සිදුවිය. | අයවැය කාර්යක්ෂම පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. | බදවා නොගත් කාර්ය මණ්ඩලය සඳහා රු.7,311,169 ක වියදම එවැනි විචල්‍යතාවයක් වූ අතර සභාවේ ආදායම් ප්‍රතිශතය අනුව වියදම් කරනු ලැබේ. මේ අනුව වියදම් සීමිත වූ අතර නියමිත කාල සීමාව තුළ අපේක්ෂිත ආදායම ලබා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් වියදම් සීමා කර තිබුණි. |